# තරුණ පරපුරේ සංවර්ධනය

## තමා හිසට තම අතමය සෙවනැල්ල

අද ගම්බද සමාජයේ යෞවන යෞවනියන් දෙස බලනවිට ඔවුන්ගේ අනාගතය තව තවත් අඳුරු වී ගෙන යන අයුරක් පෙනේ. එසේ වීමට හේතු වී ඇත්තේ ගමත් නගරයත් අතර දිනෙන් දින වැඩිවී ගෙනයන වෙනසයි.

අධ්‍යාපන පහසුකම්, සෞඛ්‍ය පහසුකම් ක්‍රීඩා පහසුකම් ඇතුළු නොයෙකුත් පහසුකම් ගැමි තරුණ තරුණියන්ට නැතිවා නොවේ. නමුත් ඒවා පවතින්නේ කුමන මට්ටමකින්ද? ගැමි තරුණ තරුණියන් එවැනි පහසුකම් සහිත ගැමි ජීවිතය අත්හැර නගරයට පිවිසීමට හේතුවී ඇත්තේ කුමක්ද? මෙවැනි ප්‍රශ්න දිනෙන් දින වැඩි වෙමින් පවතින වේගය ඒවාට සුදුසු පිළියම් යොදන වේගයට වඩා කිහිප ගුණයකින් වැඩි බැවින් අද නගර බද සමාජයට ගම්බද සමාජයන්ගෙන් පිවිසෙන්නන් බොහෝ වෙති. එසේ පිවිසීමේ දී, තවද නගරබද ජීවිතයේ කටුක ප්‍රශ්න භාජනය වෙති. රක්ෂා නොමැතිව පෙලෙන නගරබද උගත් නූගත් තරුණ තරුණියන්ගේ සංඛ්‍යාවද දිනෙන් දින වැඩි වේ. එවැනි සමාජයකට කුමන සිතිවිල්ලක් හෝ බලාපොරොත්තුවක් මන සෙහි ඇතිව නගරයට එන ගම්බද

පර්යේෂණ හා පුහුණු කිරීමේ
නිලධාරිනී

**කලාරංජී**
**මහේස්වරන්**
විසිනි.

තරුණ තරුණියන්ගේ ඉරණම කුමක්ද? එවැනි තරුණ තරුණියන් නගරයට පැමිණ කාතුයේ කුමක්ද? මේ දෙස විමසිල්ලෙන් බලන්නන්ට පෙනියන්නේ නගරයෙහි අසරණ දුගී, ජනගහනයක් ඇති කිරීමට මොවුන් සහකරුවන් වන බවයි. මෙවැනි උවදුරු රාශියකට හේතුවී ඇත්තේ ග්‍රාමීය තරුණ තරුණියන්ට මුදල් උපයා ගැනීමේ මාර්ග අවහිර වී ඇති බැවිනි. නගරය සහ ගම බේරා ගැනීමට අප විසින් කළ යුත්තේ කුමක්ද යන්න තීරණය කිරීමට කාලය එළඹී ඇත. මෙයින් මිදීමට මාර්ගයක් ලෙස සැළකිය හැක්කේ දැනට ග්‍රාමීය මට්ටමේ කෙරෙන නිෂ්පාදනයන් සීඝ්‍ර සංවර්ධනය කරා යොමු කිරීමේ වැඩ පිළිවෙලයි.



මෙබඳු ශ්‍රමදානයෙන්ද තරුණ පරපුරට වැඩදයකය

ඒ අනුව ග්‍රාමීය ජනතාව ස්ව අභිවෘද්ධිය තකා රජය සහ වෙනත් ආයතන මගින් ගෙන ඇති අරමුණු සහ ක්‍රියා පටිපාටි ගැන මනා අවබෝධයක් ලබා, සමූහිකව එහි වාසි, අවාසි, හැකි නොහැකි තැන් සාකච්ඡා කොට එම ආයතනයන්ට සුදුසු අනුබල සහ උපදෙස් ඒ හා සම්බන්ධයෙන් දන්විය යුතුයි. ගමෙහි වෙසෙන්නෝ ගම දියුණු කිරීමට පිටතින් පැමිණෙන්නන්ට වඩා ගම ගැන දන්නෝ වෙති. එහෙයින් ඔවුන්ගේ අදහස්, සිතුවිලි වැදගත්ය.

ගැමි ජනතාව එකතුවී සාකච්ඡා පවත්වා තම ගමෙහි තමන්ට අතදෙන, ආදයමක් උපයා ගැනීමට ඇති මං සොයා බැලිය යුතුයි. උදහරණයක් වශයෙන් පොල් එළවලු වවන ග්‍රාමයන්හි ඒ හා සම්බන්ධ වන හකුරු, පැණි නිෂ්පාදනය වැනි ගෘහ කර්මාන්ත කළ හැක. පොල්අතු විවීම, ඉදල්, ඉලපත් සෑදීම වැනි කාර්යයන්හි නියුක්ත විය හැක. වෙරලබඩ ග්‍රාමයන්හි මාළු වේලීම, කුඩා මාළුවන් ඇහිරීම, ඉස්සන් ඇහිරීම, ලුණු කිරීම වැනිද නිපදවිය හැක.


ගැමි ජනතාව එකතුවී සාකච්ඡා පවත්වා තම ගමෙහි තමන්ට අත දෙන, ආදයමක් උපයා ගැනීමට ඇති මං සොයා බැලිය යුතුයි. උදහරණයක් වශයෙන්, පොල් එළවලු වවන ග්‍රාමයන්හි, ඒ හා සම්බන්ධ වන හකුරු, පැණි නිෂ්පාදනය වැනි ගෘහ කර්මාන්ත කල හැක. පොල් අතු විවීම, ඉදල්, ඉලපත්, සෑදීම වැනි කාර්යයන්හි නියුක්ත විය හැක. වෙරල බඩ ග්‍රාමයන්හි මාළු වේලීම, කුඩා මාළුවන් ඇහිරීම, ඉස්සන් ඇහිරීම ලුණු කිරීම වැනි ද නිපදවිය හැක.

එසේම ගැමි තරුණියන්ට සාමූහිකව එකතු වී ඇඳුම් මසා විකිණීමේ හෝ රෙදි විවීමේ හෝ රෙන්ද ගෙතීමේ මධ්‍යස්ථානයක් පිහිටුවා ගත හැක. මෙවැනි මධ්‍යස්ථාන පිහිටුවා ගැනීමේදී ගමේ අභිවෘද්ධිය තකා අත දීමට පැමිණෙන ආයතන මාර්ගයෙන් මෙවැනි සුදුසු අලෙවි ක්‍රමයන් ගම් වැසියන් හෝ ස්වයං නිෂ්පාදනයන්හි නියුක්තව සිටින්නකට කෙලින්ම එම ආයතන සමග සාකච්ඡා පැවැත්වීමෙන් සොයා ගත හැක. මෙවැනි මධ්‍යස්ථාන මාර්ගයෙන් ඉටුවන තවත් සේවාවක් නම් ගැමි තරුණ තරුණියන් සංවිධාන කටයුතු වලට පුහුණුවක් ලබන අතර තම තමන් ස්වකීය අරමුණු, අදහස් හුවමාරු කරගෙන අවසාන වශයෙන් තම ආදයම් හා ජීවන තත්වයන් වැඩිදියුණු කර ගැනීමේ අවස්ථාවක් ඔවුන්ට හිමි වනවා ඇත.

බොහෝ විට ගමේ තරුණ තරුණියන් තුල ඇති අදහසක් නම් සාමූහික සංවිධාන නංවාලීමට මුදල්, ඇතුළු නොයෙකුත් බාහිර ආධාරයන් අවශ්‍ය බවයි. නමුත් මෙවැනි සංවිධාන ඇති කිරීමට මූලික වනුයේ තරුණ තරුණියන්ගේ එකමුතුකම හා හැකියාවයි. මෙම ප්‍රධාන අරමුණු දෙක ඇත්නම් සංවිධානයක් පිහිටුවා ගැනීම සඳහා එයට අවශ්‍ය ආධාර ලබා ගැනීම එතරම් දුෂ්කර කරුණක් විය නොහැක.

මෙම ලිපිය සියළුම ගම්බද හෝ නගරබද තරුණ තරුණියන්ගේ සිත් ළල තමන්ගේ යහපත හා අභිවෘද්ධිය උදෙසා එකමුතුව සංවිධාන පිහිටුවා තමන්ගේ ඉලක්කයන්, ජීවන තත්වය වැඩි දියුණු කිරීම හා ආර්ථිකව නිදහස් ජිවිතයක් ගත කිරීම සඳහා ගතයුතු පියවර ගැන කෙටි හැඳින්වීමක් පමණි.

මේ අනුව බලන අයව තමා හිසට තම අතළය සෙවනැල්ල යන ආප්තෝපදේශය සිහියට නැගීම වැළැක්විය හැකි නොවේ.



ගමේ සම්පත් උපයෝගී කර ගැනීමේ වැදගත් කම.